**දෙවන වාර පරීක්ෂණය - 2018**

**කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය - ii පත්‍රය**

**11 ශ්‍රේණිය**

**කාලය පැය 02**

පළමු ප්‍රශ්නය ඇතුළු ව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(1) තම පියාට අයත් බේකරියේ කුඩා කල සිටම, සළු සුළු රාජකාරින් කර කවන්ත වයස අවු. 20 වන විට බේකරි කර්මාන්තයට අදාල සියළු නිෂ්පාදිත ගැන මනා පලපුරුද්දක් ඇති තරුණයකු බවට පත් විය. පියා සමග වැඩ කරන අවධියේ, පියා ඔහුට ලබා දුන් වැටුපෙන් රු. 300000 ක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කරන ලදී. පියා ඔත්පල වීමත් සමග තමා ඉතිරිකරි කරගත් එම මුදල සමග නිවසට ආසන්නයේ කඩ කාමරයක් මාසිකව රු. 5000 ක කුලී පදනම මත මිලදී ගෙන බේකරියක් ආරම්භ කරන ලදී. එය "කමන්ත බේකර්ස්" නමින් ලියාපදිංචි කරන ලදී.

කමන්ත එය සියළුම ඇනවුම් වගකීමක් ඇතිව භාර ගෙන, ගුණාත්මක බවින් ඉහල, රසවත් නිෂ්පාදනයන් පාරිභෝගිකයින්ට සැපයීමට හැකිවිය. මෙම ප්‍රදේශයේ සියළුම බේකරි නිෂ්පාදන ඇනවුම් ඔහු වෙත ලබා ගැනීම ඔහුගේ අරමුණ විය. අනාගතයේ දවසක එම තත්ත්වයට ළගා වීමට හැකි වන බව ඔහුගේ විශ්වාසයයි. ඔහුගේ බේකරි නිෂ්පාදන අලෙවි කර ගැනීමට ප්‍රදේශය පුරා ජංගම සේවාවක් ද ආරම්භ කළේය.

1. කමන්තගේ ව්‍යාපාරයෙහි දක්නට ඇති ව්‍යවසාය ගති ලක්ෂණ 2 ක් නම් කරන්න.
2. කමන්තගේ ව්‍යාපාරයෙහි සඳහන් අවශ්‍යතාව හා වුවමනා සඳහන් කරන්න.
3. මෙම ව්‍යාපාරයෙහි හැඳින්විය හැකි ව්‍යවසායක වර්ගය නම් කරන්න.
4. කමන්ත ගේ ව්‍යාපාරයට අරමුදල් සම්පාදනය කර ගත හැකි මාර්ග 2 ක් දක්වන්න.
5. මෙම ආයතනයෙහි දැක්ම සඳහන් කරන්න.

2017 ජනවාරි මාසයේ පහත සඳහන් ගනුදෙනු සිදු විය.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය - පිටි සඳහා | රු. 25000 |
| නිෂ්පාදන වැටුප් | රු. 5000 |
| විදුලි වියදම් | රු. 3000 |
| ත්‍රී වීල් රථ කුලිය | රු. 2000 |

6. මෙම ව්‍යාපාරයේ, ආරම්භක ප්‍රාග්ධනය කොපමණද?
7. ශුද්ධ ලාභය ගණනය කර දක්වන්න.
8. ඍජු නිෂ්පාදන පිරිවැය ගණනය කර දක්වන්න.
9. මෙම ව්‍යාපාරයේ මුදල් ගලා ඒම් වල වටිනාකම දක්වන්න.
10. මෙම ව්‍යාපාරයේ වියදම්වල නිෂ්පාදන නොවන පිරිවැය වලට උදාහරණ 2 ක් සඳහන් කරන්න.

(ලකුණු $2 \times 10 = 20$)

(2) "ගැටළු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හා නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාව නිර්මාණශීලිත්වයයි."

1. නිර්මාණශීලිත්වය වර්ධනය කර ගැනීමට ගතහැකි ක්‍රියා මාර්ග 2 ක් දක්වන්න.
2. නිර්මාණශීලිත්වයට බාධාකාරි වන සාධක දෙකක් විස්තර කරන්න.
3. නවෝත්පාදනය සිදු විය හැකි ආකාර 2 ක් උදාහරණ සහිතව ලියා දක්වන්න.

4. දී ඇති පැහැදිලි කිරීමට වඩාත් ගැලපෙන ගති ලක්ෂණය නම් කරන්න.
   i. ගැටළු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට ඇති හැකියාව
   ii. පරිසරයේ වෙනස්වීම්වලට උචිත පරිදි අනුගාමී වීමට ඇති හැකියාව
5. නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය අතර ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

(ලකුණු $2 \times 5 = 10$)

(3) "ව්‍යවසායකයා අපූරු පුද්ගලයෙකි. ඔහු තමාගේ කුසලතා උපයෝගී කර ගනිමින් සමාජයටත්, රටටත් ප්‍රතිලාභ ලබාදේ."

1. ව්‍යවසායත්වය තුලින් ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ 2 ක් ලියන්න.
2. ව්‍යවසායත්වය තුලින් ඇතිවන සමාජීය ප්‍රතිලාභ 2 ක් නම් කරන්න.
3. ව්‍යවසායත්ව කුසලතා අතර මානව කුසලතාව හඳුන්වන්න.
4. බොහෝ කුඩා පරිමාණ ව්‍යාපාර ආරම්භ කළ ද පසු කාලීනව අසාර්ථක වීමට හේතු වන කරුණු 2 දක්වන්න.
5. "වෙළෙඳපල හිඩැස " සංකල්පය පහදන්න.

(ලකුණු $2 \times 5 = 10$)

(4) අද ලෝකයේ බිහිවී ඇති සියළු භාණ්ඩ හා සේවා ක්‍රියාවලි හා ක්‍රම ශිල්ප මිනිසා මුහුණ දුන් ගැටළුවකට විසඳුමක් ලෙස ඉදිරිපත් වූ ඒවා වන අතර ඒ සියල්ල ව්‍යාපාර අදහස් වල ප්‍රතිඵලය.

1. හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ 2 ක් දක්වන්න.
2. ව්‍යාපාර අදහස් මූලාශ්‍ර 2 ක් ලියන්න.
3. ව්‍යාපාර සැලැස්මක මූලිකාංග දක්වන්න.
4. යම් ව්‍යාපාරයකට සැලැස්මක් නොමැති වීමෙන් එම ව්‍යාපාරය මුහුණපාන ගැටළු 2 ක් දක්වන්න.
5. අලෙවි සැලැස්මක ඇතුලත් කොටස් 2 ක් නම් කරන්න.

(ලකුණු $2 \times 5 = 10$)

(5) පහත සඳහන් වන්නේ ධම්මිකගේ ව්‍යාපාරයේ 2017 වර්ෂයේ ව්‍යාපාර සැලැස්මෙන් ඉදිරි වර්ෂය සඳහා උපුටා ගත් තොරතුරු කිහිපයකි.

1. ධම්මික ව්‍යාපාරයට රු. 200000 යෙදවීය.
2. රු. 75000 හා භාණ්ඩ තොගයක් මිලදී ගැනීම.
3. බැංකුණය ලබා ගැනීම රු. 50000
4. කිරුම් මිණුම් උපකරණ කට්ටලයක් මිලදී ගැනීම රු. 10000
5. අලෙවි ආදායම රු. 20000
6. ගොඩනැගිලි කුලී ගෙවීම රු. 3000
7. වැටුප් ගෙවීම රු. 5000
8. ණය ගැතියන්ගෙන් ලැබීම රු. 25000
9. යතුරු පැදියක් මිලට ගැනීම රු. 75000
10. ණය හිමියන්ට ගෙවීම රු. 12000

1. කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය දැක්වෙන ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරන්න.

(ලකුණු $2 \times 5 = 10$)

(6) " වෙළඳපල විශ්ලේෂණයක මූලික පරමාර්ථය වන්නේ අලෙවි සැලැස්ම වඩාත් නිවැරදිව පිළියෙල කර ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමයි."

1. වෙළෙඳ පල විශ්ලේෂණයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
2. වෙළෙඳපල විශ්ලේෂණයකට අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි ක්‍රම 2 ක් දක්වන්න.
3. අලෙවි මිශ්‍රයේ ප්‍රධාන විචල්‍යයන් නම් කරන්න.
4. විකුණුම් ප්‍රවර්ධනයේ මූලික අරමුණ කුමක්ද?
5. භාණ්ඩයක මිල තීරණය කිරීමේදී සලකා බලන සාධක 2 ක් නම් කරන්න.

(ලකුණු $2 \times 5 = 10$)